# 2025 දෙසැම්බර් මස විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව
දිනය - 2025.12.08
වේලාව - පෙ.ව. 11.00

පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | එම්.ඒ.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | එන්.ටී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | පී.එම්.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | බී.කේ.නිලුකා කුමුදුනී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | කේ.ජී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | සුදත් චමින්ද උයනහේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | බී.නිපුන ගයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | එල්.වයි.නුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | ජේ.ඒ.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | එල්.ඒ.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

| | නම | | තනතුර |
|---|---|---|---|
| XXII. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව පෙ.ව.11.00 පමණ ,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ දෙසැම්බර් මස විශේෂ මහ සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාත් ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදි.



CamScanner

2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමය යෝජිත අයවැය සම්මත කර ගැනීම සඳහා අද දින විශේෂිත සභාව කැඳවීමට හේතු වූ බවත්,ඒ සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත ස්තුතිය පුදකරන බව ප්‍රකාශ කරන ලදී

## 02) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

ඇති වූ දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ගං වතුර සහ නාය යෑම් ආපදා තත්වය හේතුවෙන් මියගිය අය වෙනුවෙන්, විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.

➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

සුනාමිය අවස්ථාවේ සිදු වූ ආපදාවට වඩා වැඩි අපදා තත්වයක් දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ බවත්,මෙහි දී තිස්සමහාරාම ප්‍රදේශයේ ද කිරිඳි ඔය ආශ්‍රිතව ද ගං වතුර ගැලීමකට ලක් වූ බැවින්, එම අවස්ථාවේ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මෙන්ම බලප්‍රදේශයේ අනිකුත් සියළු රාජ්‍ය ආයතන අපදාවට ලක් වූ පිරිසට සහන සැලසීමට කඩිනමින් ඉදිරිපත් වූ බැවින් ඇති වූ ආපදා තත්වය දින දෙකක් වැනි කෙටි කාලයක් තුළ යථාතත්වයට පත් කරගැනීමට හැකි වූ බවත් ,මෙම අවස්ථාවේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍යතුමා, මහජන සෞඛ්‍ය පරීක්ෂ නිලධාරිතුමන්ලාට සහ රාජ්‍ය ආයතන වල කාර්යමණ්ඩල වලට විශේෂ ස්තුතියක් පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.එමෙන් ම රට තුළ ඇති වූ අපදා තත්වයන් යථාතත්වයට පත් කර ගැනීම සඳහා රජය මේ වන විට විශාල වෙහෙසක් දරමින් සිටින බවත්, 2025 වර්ෂයේ අය වැය තුළ ආපදාවන් සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති බැවින් රට යථා තත්වයට පත් කිරීම සඳහා ණය ලබාගැනීමේ අවශ්‍යතාවක් පැන නොනගින බවට ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කර තිබෙන බවත්,එමෙන්ම නැවත රට ගොඩනගා ගැනීම සඳහා මේ අවස්ථාව වන විට විදෙස් ආධාර විශාල ප්‍රමාණයක් සහ සහයෝගීත්වයක් ලැබෙන බැවින් සියළුදෙනා එක්ව කඩිනමින් කටයුතු කිරීමෙන් රට යථාතත්වයට පත්කර ගැනීමට හැකිබවත් ප්‍රකාශ කරන ලදි. එමෙන්ම මෙම අවස්ථාවේ මෙකී ඛේදවාචකයට ලක්වූ සහ ආපදාවට ලක් වූ සියළුදෙනා වෙනුවෙන් වචයකින් හෝ සහන සැලසීමට ඉදිරිපත් වූ සියළුදෙනාටම ස්තුතිය පුද කරන ලදි.

➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.විරේන්ද්‍ර විරාජ් මහතා

තිස්සමහාරාම ප්‍රදේශයේ ඇති වූ අපාදා තත්වයට මුහුණ දුන් ජනතාව වෙනුවෙන් සහන සැලසීමේ දී සභාපතිතුමා ඇතුළු සියළුදෙනා සහයෝගයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව ඉතාමත් සතුටුවන බවත් ,ඇල්ලගල ප්‍රදේශයේ පැනනැගුණු ගැටළුකාරි තත්වය මඟ හරවා ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් විශාල සහයෝගයක් සහයෝගයක් ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදි.

➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි මහත්මිය

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු පිරිස තිස්සමහාරාම ප්‍රදේශයේ ආපදාවට ලක් වූ ජනතාව වෙනුවෙන් සහන සැලසීමේ දී කිසිදු දේශපාලන පක්ෂ භේදයකින් තොරව කටයුතු කළ බවත් ඒ වෙනුවෙන් සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු පිරිසට ස්තුතිය පුද කරන ලදි.

➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය

දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ආපදා තත්වයෙන් මියගිය අය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්, තිස්සමහාරාම ප්‍රදේශයේ ඇතිවූ ආපදා තත්වය හමුවේ සඳගිරිගම මාර්ගය පළුදු වී ඇති බැවින් එම මාර්ග නැවත යථාතත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු



CamScanner

කරදෙන මෙන් ඉල්ලීම කළ අතර ඇති වූ ආපදා තත්වය හමුවේ කිසිදු දේශපාලන පක්ෂ භේදයකින් තොරව ආපදාවට ලක් වූ ජනතාවට සහන සැලසීමේ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු පිරිසට ස්තූතිය පුද කරන ලදි.එමෙන් ම රට මුහුණු දුන් අපදා තත්වය හමුවේ රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය සහ ජනතාවට සහන ලබාදීම වෙනුවෙන් ජනාධිපතිතුමා සහ රජයට ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ අපදා තත්වය හේතුවෙන් මියගිය අයවෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්,ඉතිහාසයේ ස්වභාවිකව සිදු වූ දරුණුම ඛෙදවාචකය මෙය බවත්, සුනාමි ව්‍යසනයට වඩා වැඩි හානියක් මෙම ඛෙදවාචකයෙන් සිදු වී ඇති බවත් ආසන්න වශයෙන් එම හානිය රු.බිලියන 07 ඉක්මවා ඇති බවට ගණනය කිරීම සිදු කර ඇති බව ප්‍රකාශ කරන ලදි.වාර්ෂක අයවැය තුළ ආපදා සඳහා රු.මිලියන 33 ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් මෙම තත්වය තුළ අදාළ කටයුතු සිදු කිරීමට මුදල් වෙන් කිරීමේ ගැටළුවක් පැන නොනගින බවත් ප්‍රකාශ කරන ලදි.මෙම ආපදා තත්වය හමුවේ තිස්සමහාරාම බලප්‍රදේශයේ ද අපදාවට ලක්විය හැකි බවට දැනුම්දුන් අවස්ථාවේ දි පෙර සූදානම සඳහා ආපදා කමිටු රැස් කරමින් අදාළ කටයුතු සිදු කිරීමට දේශපාලන අධිකාරියක් ලෙස තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවට හැකියාව ලැබූ බවත් ඒ සඳහා නියෝජ්‍ය අමාත්‍ය රුවන් සෙනරත් මහතා , වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය අරවින්ද සෙනරත් මහතා ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති නිහාල් ගලප්පත්ති මහතා , වාරිමාර්ග ඉංජිනේරුතුමා සහ තිස්සමහාරාම ප්‍රාදේශිය ලේකම්තුමා විශාල සහයෝගයක් ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදි. එසේම ගංවතුර බැස යාමෙන් පසුවද පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් සහන සැලසීමේ අවශ්‍යතාව පැනනැගුණ බැවින් ඒ සඳහා තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව, තිස්සමහාරාම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ත්‍රිවිධ හමුදාවේ අපදා ඒකකය, හම්බන්තොට ලුණු ලේවාය, ග්‍රාම සංවර්ධන කමිටු සමාජිකයින්,මහජන ආරක්ෂණ සමිති නිලධාරින් සහ ග්‍රාමීය ප්‍රජාව මහත් සහයෝගයක් ලබා දුන් බවත් ඒ වෙනුවෙන් සියළුමදෙනාට ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.ආපදා තත්වය හේතුවෙන් තිස්සමහාරාම බලප්‍රදේශයේ තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති 07 ම අක්‍රිය වූ බැවින් ඒ සඳහා පෙර සූදානම් ව සිටීම නිසා ජලය බෙදා හැරීමේ කටයුතු නිසි පරිදි සිදු කිරීමට තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවට හැකි වූ බවත්, ඒ සඳහා නිහාල් ගලප්පත්ති මහතාගේ සහය මෙන්ම ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය සභාවේ සහය ලබාදුන් බවත් ඒ සඳහා ද ස්තූතිය පුද කරන ලදි.තව ද මෙම අවස්ථාවේ දි තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව විසින් අනතුරුදායක ගස් ඉවත් කිරිම ,ගලි සේවාව වැනි සේවාවන් නොමිලේම ලබාදීමට කටයුතු කළ බවත්, මෙම ආපදා තත්වය තුළ ජනතාවට සහන සැලසීම සඳහා සහය ලබාදුන් සියළුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටත්, ලේකම්තුමිය ඇතුළු ට කාර්යය මණ්ඩලයටත් ස්තූතිය පුද කරන ලදි. ඇතිවූ ඛෙදවාචකය හේතුවෙන් වැටුණ රට නැවත ගොඩනැගීමට සියළු ම දෙනා ම සහයෝගයෙන් එකමුතුව එකට කටයුතු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

මෙම ආපදා තත්වය ඇතිවූ වහාම දේශපාලන අධිකාරියේ මැදිහත්වීම මත හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම පළාත් පාලන ආයතන වල සභාපතිවරු කැඳවා විධිමත් සැලැස්මක් සකස් කළ බවත්,ආපදා තත්වය තුළ කටයුතු කරගෙන යාමේදී ඇතිවිය හැකි නීතිමය සීමාවන් ඉවත් කර අදාළ කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබාදීම වෙනුවෙන් රජයට ස්තූතිය පුද කළ

බවත් ප්‍රකාශ කරන ලදි.හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්වූ තිස්සමහාරාම ප්‍රදේශයේ ජනතාවට සහන සැලසීම සඳහා මැදිහත් වූ තිස්සමහාරාම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩය සහ ග්‍රාම නිලධාරින්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, හම්බන්තොට ලුණු ලේවායේ කාර්යමණ්ඩලය ,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා ඇතුළු මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරීන් , සමූපකාර සමිතිය, තිස්සමහාරාම ව්‍යාපාරික ප්‍රජාව, ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය සභාව,සූරියවැව ප්‍රාදේශිය සභාව,හම්බන්තොට ප්‍රාදේශිය සභාව,ආපදා කළමනාකරණ ඒකකය ,ත්‍රිවිධ හමුදාව සහ තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩය සහ විශේෂයෙන් රියදුරු මහත්වරුන් සඳහා ස්තුතිය පුද කරන ලදි.

දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් අවතැන් වූවන් වෙනුවෙන් සහන සැලසීමට සඳහා තිස්සමහාරාම ප්‍රෙද්ශයෙන් සහන කණ්ඩායමක් අම්පාර හසලක ප්‍රදේශයේ සඳහා 2025.12.09 වන දින පිටත්ව යාමට නියමිත බවත් ඒ සඳහා හැකි සියළුදෙනා සහභාගි වන ලෙසත්, ජාතික මට්ටමින් රට පුරා විවිධ ආගමික ස්ථාන වල සිදු කිරීමට නියමිත අධිෂ්ඨාන ආශිර්වාද පූජාව 2025.12.09 වන දින සවස 6.00 ට තිස්සමහාරාම රජමහා විහාරස්ථායේ සිදු කිරීමට නියමිත බැවින් ඒ සඳහා සියළුදෙනා සහභාගිවන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ගං වතුර සහ නාය යෑම් ආපදා තත්වය හේතුවෙන් විශාල පිරිසක් අවතැන් ව ඇති බවත් , අවතැන් වූවන් වෙනුවෙන් සහන සැලසීමට ඉදිරිපත්ව සිටින සියළුදෙනාම වෙනුවෙන් මෙම ගරු සභාවේ විශේෂ ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.

(පෙ.ව.11.30ට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා සභාවට පැමිණෙන ලදි.)

<u>03.විශේෂ කාරණය</u>

- <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය කෙටුම්පත අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට මෙම ගරු සභාවට යොජනා කරමි.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය කෙටුම්පතේහි සභාවට ඉදිරිපත් කරන ලද සාරාංශය පහත දක්වා ඇත.

| 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත සමස්ත ආදායම (රු) | |
|---|---|
| ස්වයං උත්පාදන ආදායම | 130,379,847.26 |
| පරිපාලනමය ප්‍රතිපූර්ණ | 86,115,791.04 |
| මූලධන ලැබීම | 398,500,000.00 |
| එකතුව | 614,995,638.30 |
| | |
| 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත සමස්ත වියදම (රු) | |
| පුනරාවර්තන වියදම | 177,860,246.16 |
| මූලධන ගෙවීම | 429,120,000.00 |

| | |
|---|---|
| ණය ආපසු ගෙවීම | 7,779,498.98 |
| එකතුව | 614,759,745.14 |
| | |
| 2026 වර්ෂයේ අතිරික්තය (රු) | |
| ඇස්තමේන්තුගත සමස්ත ආදායම | 614,995,638.30 |
| ඇස්තමේන්තුගත සමස්ත වියදම | 614,759,745.14 |
| වර්ෂයේ අතිරික්තය | 235,893.16 |

2026 වර්ෂයේ අයවැය තුළ ප්‍රධාන වශයෙන්ම 01).පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා , 02).සෞඛ්‍ය සේවා, 03).භෞතික සැලසුම්,මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි, 05).පොදු උපයෝගිතා, 06).සුභසාධන සේවා වැඩසටහන් පහක් ඔස්සේ ක්‍රියාත්මක වීමට නියමිත බවට ප්‍රකාශ කරන ලදි.එ් අනුව කාර්යාලයේ උපකරණ නවීකරණ කටයුතු සිදු කිරීම , යන්ත්‍රසූත්‍ර යම් ප්‍රමාණයක් අලුතින් ලබාගැනීමට සැලසුම් කිරීම, ගලි අපහරණ පද්ධතියක් හා කසළ දාහකයක් සකස්කිරීම, ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් සංවිධානය කර ඇති හරිතාගාර වගාව ගෙවතු වගාව වැනි දේ සඳහා නිශ්චිත ඉඩම් කොටසක් වෙන්කරවා ගැනීම, මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර විශේෂිත ඒකකයක් පිහිටුවීම,ගලිබවුසරයක් මිල දී ගැනීම,ටිපර් රථ දෙකක් මිල දී ගැනීම, ජෙනරේටරයක් මිල දී ගැනීම ,ශබ්ද විකාශන කට්ටලයක් මිල දී ගැනීම,මහසෙන්පුර ආදාහනාගාරයේ පෙරනිම් නිෂ්පාදන (කුට්ටි ගල්,හියුම් පයිප්ප,කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන ) සිදු කර ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සඳහා යොදා ගැනීමටත්,කාර්යය මණ්ඩල සහ සියළු ප්‍රෙද්ශ එක්ව සුභ සාධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නියමිත බවත්,හෙළ භෝජුන්හලක් ඉදිකිරීමට සැලසුම් කිරීම, උද්ධගන්දර ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිලි වල සෝලා පැනල් සවිකර එයින් බලය ලබාගැනීම, මංමාවත් නවීකරණය කිරීමට අදහස් කරන බවත් ඒ සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන, පළාත් පාලන නිශ්චිත ප්‍රතිපාදන සහ ප්‍රාදේශීය සභා අරමුදල් මෙම කාර්යයන් සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත බවට අදහස් දක්වන ලදි.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

2025 වර්ෂයේ ජූනි මස 02 දිනෙන් පසුව විශාල ප්‍රමාණයක අයවැය ගත නොවූ ප්‍රාග්ධන පළාත් නිශ්චිත ප්‍රතිපාදන , අමාත්‍යංශ ප්‍රතිපාදන ලැබූ බවත් එමගින් බහුකාර්යය ගොඩනැගිල්ලේ පහළ කොටස කාපට් කිරීම ,උද්ධගන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ද්‍රව්‍ය ප්‍රතිසාධන ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම,තිස්සමහාරාම පූජා නගරයේ ඉදිවෙමින් වෙමින් පවතින වැසිකිළි පද්ධතිය වැනි ප්‍රාග්ධන වත්කම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට හැකි වූ බවත් වෙනත් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස මාර්ගස්ථ මගී ප්‍රවාහනයට ලක්ෂ 10 ක මුදලක් සහ සංචාරක අමාත්‍යංශය වෙතින් ලක්ෂ 20ට ආසන්න ප්රතිපාදන ප්‍රමාණයක් ලැබූ බවත් එමගින් අඳගලවැල්ල වෙරළ පිවිසුම් මාර්ගය සකස් කිරීම සිදුවෙමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

පසුගිය වර්ෂයන් හා සංසන්දනය කරන විට 2026 වර්ෂය තුළ දී ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කිරීම ඉහළ අගයක් ගන්නා අතර එය මුළු වියදමින් 69% පමණ වන බවත්, පොදු පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා වැඩසටහන යටතේ අනෙක් සියළුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ,භෞතික හා මානව සම්පත් සැලසුම් කිරීම,සංවිධානය කිරීම, මෙහෙයවීම හා පාලනය සිදුවන්නේ මෙම වැඩසටහන යටතේ බවත්,එබැවින් මෙම



CamScanner

වැඩසටහන යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස රු.76,000,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර ඇති බවත් මේ යටතේ කාර්යාල සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින් ඒ යටතේ ඉදිකෙරෙමින් පවතින බහුකාර්යය ගොඩනැගිල්ලේ වහළය සකස් කිරීම,සභා කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු සහ එහි කාණු පද්ධතිය සකස් කිරීම ඉදිරි වර්ෂයේ දී අපේක්ෂා කරන බවත් කාර්යාලය සංවර්ධනය කිරීම තුළින් ජනතාව වෙත ලබාදෙන සේවාවන්හි ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව කාර්යක්ෂමතා වර්ධනය කර ගැනීමට හැකිවන බවත් අනෙකුත් වැඩසටහන් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන බවත් එමගින් අපේක්ෂා කරන ඉලක්ක කරා ඉක්මනින් ළඟාවීමට අවස්ථාව ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදි.

පුනරාවර්තන වියදම් ලෙස වෙන් කරන ලද ප්‍රතිපාදන තුළ ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික ආරක්ෂණ සේවාවන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට අපේක්ෂා කරන බවට ප්‍රකාශ කරන ලදි.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ,විෂය නිලධාරී බී.එල්.පී.රසාංග මහතා සහ කාර්යමණ්ඩලයේ සියළුම දෙනාගේ සහයෝගය මත 2026 වර්ෂය සඳහා මෙවැනි සාර්ථක අයවැය ඉදිරිපත් කිරීමට හැකියාව ලැබූ බැවින් ඒ සඳහා සියළුදෙනාටම ස්තූතිය පුද කරන ලදි.

➢ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

විශාල සංවර්ධන ඉලක්ක ප්‍රමාණයක් ළඟා කරගැනීමට හැකියාවක් සහ විශාල ආදායම් ප්‍රමාණයක් එකතු කර ගැනීමට හැකිවන සාර්ථක අයවැයක් 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට හැකි වී ඇති බවට ප්‍රකාශ කරන ලදි.

ග්‍රාමීය සංවර්ධනය සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම සිදුවන්නේ තුන්වන වැඩසටහන වන භෞතික සැලසුම්,මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි යටතේ වන බවටත් ප්‍රකාශ කරන ලදි.

2026 වර්ෂයේ අයවැය තුළින් මෙම වැඩසටහනේ ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.169,500,000.00 දැක්වෙන අතර ප්‍රාග්ධනික වියදම සඳහා රු.163,258,462.58 ඇස්තමේන්තු කර ඇති බවත් ඒ යටතේ ග්‍රාමීය මාර්ග නඩත්තුව හා බෝක්කු ඉදිකිරීම සඳහා රු.60,000,000.00 මුදලක් 2026 තුළ වෙන් කර ඇති බවත් මින් පෙර අයවැයක් තුළින් එපමණ මුදලක් වෙන් කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදි. පවතින කාපට් මාර්ග සංවර්ධනය කිරීම සඳහා රු.5,000,000.00ක ප්‍රතිපාදන වෙන් කිරීම අලුතින් සිදු කළ බවත් හඳුනාගත් මාර්ග කිහිපයක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත් , අත්‍යාවශ්‍ය බෝක්කු සංවර්ධනය සඳහා සභා අරමුදලින් රු.5,000,000.00 වෙන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.

මෙලෙස පසුගිය අයවැයන්ට සාපේක්ෂව 2026 වර්ෂයේ වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීමට හැකියාව ලැබී ඇත්තේ මෙම අයවැය මගින් වැඩි ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර ඇති බවටත් ප්‍රකාශ කරන ලදි.ඒ අනුව ස්වයං උත්පාදන ආදායම වැඩි කර ගැනීමට හා රජයෙන් ලැබෙන ප්‍රතිපාදන වැඩි කර ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි.

ස්වයං උත්පාදන ආදායම වැඩි කර ගැනීම සඳහා මේ වන විටත් පන්නේගමුව හා දෙබරවැව පොළවල් පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව 2026 වර්ෂය සඳහා ඉහළ ලංසු මුදලකට බදු දීමට හැකි වූ බවත් , රජයෙන් ප්‍රාදේශීය සභා සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී ඇති බැවින් එයද සැලකිල්ලට ගෙන මෙවර අයවැය සඳහා රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඇස්තමේනතු කළ බවත් ප්‍රකාශ කරන ලදි.ඒ අනුව තිස්සමහාරාම ප්‍රදේශයේ ජනතාවගේ භෞතික හා මංමාවත්



CamScanner

අවශ්‍යතා හඳුනාගනිමින්, විශාල සංවර්ධන ඉලක්කයන් කරා කඩිනමින් ළඟාවීමට 2026 වර්ෂය තුළදී බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙවැනි සාර්ථක අයවැයක් 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට වෙහෙස මහන්සි වූ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ,විෂය නිලධාරි බී.එල්.පී.රසාංග මහතා සහ කාර්යමණ්ඩලයේ සියළුම දෙනාට සියළුදෙනාටම ස්තූතිය පුද කරන ලදී.

➢ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා</u>

තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ අවධානය යොමු කරනුයේ සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ වන බවත් ඒ අනුව 2026 වර්ෂයේ අයවැය තුළින් මෙ සඳහා ප්‍රාග්ධන ලැබීම ලෙස රු.172,500,000.00 සහ ප්‍රාග්ධන වියදම රු.164,041,036.40 ලෙසට ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

උද්ගන්දර කසළප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ,ඝණ අපද්‍රව්‍ය කළමණාකරන කටයුතු සිදු කිරීම, සංචාරකයින් සඳහා නවාතැන් සපයන ස්ථානයක් ආරම්භ කිරීම,පළතුරු උද්‍යානයක් ඉදිකිරීම බලාපොරොත්තු වන බවත් එමඟින් අනාගතයේ දී ආදායමක් ඉපයීමට බලාපොරොත්තු වන බවත් , නව ගලි බවුසර රථයක් මිලදී ගැනීම සහ ටිපර් රථදෙකක් මිලදී ගැනීමට අදහස් කරන බවත් එමගින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීමට හැකියාව ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

2026 වර්ෂය තුළ ,මෙවැනි ඉලක්ක ළඟා කර ගනිමින් ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය සම්පන්න සුවදායී ජීවිතයක් ලබාදීමට අපේක්ෂා කරන බවට ප්‍රකාශ කරන ලදී.

➢ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.වමින්ද ජයනාත් මහතා</u>

තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය යාවත්කාලීන කිරීම 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කරන අයවැයෙන් බලාපොරොත්තු වන බවත්, ඒ අනුව පොදු උපයෝගීතා සේවා සඳහා 2026 වර්ෂයේ අයවැයෙන් ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.500,000.00 වෙන්කිරීම සිදු කර ඇති බවත් ප්‍රාග්ධන වියදම් රු.150,000.00 වෙන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මෙ වන විට ප්‍රදේශයේ පුරා අවිධිමත්ව සවිකර ඇති වීථි ලාම්පු විධිමත් කරලීමටත්, වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම ක්‍රමවත්ව සිදු කිරීමටත් බලාපොරොත්තු වන බවත් එමගින් ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවමින් සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට 2026 වර්ෂය තුළ දී බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

➢ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය</u>

2026 වර්ෂයේ අයවැය මඟින් සුභසාධක සේවා පහසුකම් වැඩසටහන සඳහා ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.5,000,000.00 ක ඇස්තමේන්තු කර ඇති අතර ප්‍රාග්ධන වියදම් ලෙස රු.32,000,000.00 ක වෙන් කිරීමක් සිදු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

මෙම වැඩසටහන යටතේ 2026 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට යෝජිත විධිමත් වැඩසටහනක් පවතින බවත් , ඒ අනුව මෙතෙක් පෙර පාසල් නිල ඇඳුම් සඳහා ගාස්තු අය කිරීමක් සිදු කළමුත් 2026 වර්ෂයේ සිට පෙර පාසල් නිල ඇඳුම් සඳහා ගාස්තු අය නොකිරීමටත්,පන්නේගමුව පෙර පාසල ආනාරක්ෂිත ගොඩනැගිල්ලක පැවතීම හේතුවෙන් 2026 වර්ෂයේ දී එය නව ගොඩනැගිල්ලකට රැගෙන යාමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

පුස්තකාල අංශය සංවර්ධනය කිරිම යටතේ පුස්තකාල පාඨක පිරිස වැඩි කරගැනිමෙ අරමුණින් වසම තුළ ජංගම පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වන බවත්, මහසිලව පුස්තකාලය වායු සමීකරණය කිරීමටත්, මහසිලව පුස්තකාලෙයේ එළිමහනේ පවතින කියවීමෙ ස්ථානය විධිමත්ව නවීකරණය කිරීමටත්,පුස්තකාලයේ එළිමහන් පරිශ්‍රය ආකර්ශනිය ලෙස සකස් කිරීමටත්,පුස්තකාලයට පිටතින් නව වැසිකිළියක් ඉදි කිරීමටත් 2026 වර්ෂය තුළ දී බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

ආයුර්වේද සංවර්ධනය කිරිම යටතේ ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා නව ආයුර්වේද ඔසුසලක් ආරම්භ කිරීමටත්, දැනට පවතින තිස්සමහාරාම හා යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථාන දෙකෙහි නිමි ඖෂධ හා අමු ඖෂධ ප්‍රමාණය වැඩි කරමින් ජනතාවට ලබාදීමටත් ,ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමටත්,හෙළ හොජුන්හලක් ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

සුභ සාධක සේවා පහසුකම් යටතේ ක්‍රීඩාපිටි සංවර්ධනය කිරිමටත්,ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරිම සඳහා ක්‍රීඩාවට හා සාහිත්‍යයට මුල් තැන දෙමින් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට බලාපොරෙoාත්තු වන බවත්,2026 වර්ෂය තුළ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවට ලස්සන ජීවිත ගොඩනැගීම අපගේ අභිප්‍රාය වන බවත් ප්‍රකාශ කරන ලදි.

(පෙ.ව.11.45ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.සුනිල් පියංකර මහතා සභාවට පැමිණෙන ලදි.)

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය සභා සම්මත කිරිම සඳහා ඡන්ද විමසීමක් අවශ්‍ය බවට මන්ත්‍රීතුමන්තාගේ අදහස වන බැවින් ඒ සඳහා ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතාගේ යෝජනාවෙන්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් පෙ.ව.11.50 ට ගරු මහ සභාව කාරක සභාවක් බවට පත්විය.

2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරිමට යෝජිත අයවැය කෙටුම්පත අනුමැතියට ඉදිරිපත් කිරීමෙ ඡන්ද විමසීම ප්‍රතිඵලය පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| | නම | පැමිණීම | ඡන්දය ප්‍රකාශ කිරීම | | | |
|---|---|---|---|---|---|---|
| | | | පක්ෂව | විපක්ෂව | වැළකීසිටීම | සභා ලර්භයේ සිටීම /නොසිටීම |
| 1 | එච්.එල්.ජයසිරි | √ | √ | | | |
| 2 | ආර්.රජිත් ප්‍රියදර්ශන | √ | √ | | | |
| 3 | හර්ෂ උදයකුමාර ජයවීර | √ | √ | | | |
| 4 | ආර්.කේ.එම්.රෝහිත | X | | | | |
| 5 | එම්.එල්.එම්.හනීෆා | √ | √ | | | |
| 6 | කේ.රත්න | √ | √ | | | |
| 7 | එම්.ඒ.ආරියසේන | √ | √ | | | |
| 8 | එන්.ටී.වමින්ද ජයනාත් | √ | √ | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9 | පී.එම්.අනුර ප්‍රියන්ත | √ | √ | | | |
| 10 | එම්.එල්.එම්.අසාර් | √ | √ | | | |
| 11 | බී.කේ.නිලූකා කුමුදුනී | √ | √ | | | |
| 12 | ආර්.ඩබ්ලිව්.සිරිසේන | √ | √ | | | |
| 13 | කේ.පී.තමිලා දිල්රුක්ෂි | √ | √ | | | |
| 14 | සුදත් චමින්ද උයනහේවා | √ | √ | | | |
| 15 | බී.නිපුන ගයාශාන් | √ | √ | | | |
| 16 | එස්.දයාසේන | √ | √ | | | |
| 17 | එල්.වයි.නුවන් චතුරංග | √ | | | √ | |
| 18 | ජේ.ඒ.තනුජා දිලානි | √ | | | √ | |
| 19 | උදානි ලියනගේ | √ | | √ | | |
| 20 | එල්.ඒ.සුනිල් පියංකර | √ | | √ | | |
| 21 | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි | √ | | | √ | |
| 22 | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | √ | | √ | | |
| | එකතුව | 21 | 15 | 03 | 03 | 00 |

ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතාගේ යෝජනාවෙන් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පෙ.ව.12.00 ට කාරක සභාව ගරු මහ සභාව බවට පත්විය.

ඒ අනුව , 2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් අවතැන් වූවන් වෙනුවෙන් සහන සැලසීමට සඳහා තිස්සමහාරාම ප්‍රෙද්ශයෙන් සහන කණ්ඩායමක් අම්පාර හසලක ප්‍රදේශයේ සඳහා 2025.12.09 වන දින පිටත්ව යාමට නියමිත බවත් ඒ සඳහා හැකි සියළුදෙනා සහභාගී වන ලෙසත්, ජාතික මට්ටමින් රට පුරා විවිධ ආගමික ස්ථාන වල සිදු කිරීමට නියමිත අධිෂ්ඨාන ආශිර්වාද පූජාව 2025.12.09 වන දින සවස 6.00 ට තිස්සමහාරාම රජමහා විහාරස්ථායේ සිදු කිරීමට නියමිත බැවින් ඒ සඳහා ද හැකි සියළුදෙනා සහභාගීවන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

අද දින විශේෂ මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමියටත්,ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.12.15 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

සභාපති
එච්.එල්.ජයසිරි,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 08 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.



CamScanner